

## යේසුස් වහන්සේගේ ඉගැන්වීම්

බයිබලයේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම් බොහෝ කලක් සිට මනුෂ්‍ය වර්ගයාට දිව්‍යමම ආනුභාවය උල්පතක් වේ. මොර්මන් ග්‍රන්ථය වනාහි, ගැලවුම්කරුවාණන් වහන්සේගේ අමතර ඉගැන්වීම් වචන සහය පොත් කාණ්ඩයක ශුද්ධවූ ලියවිලි වේ. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ තවත් ගිවිසුමකි. ඔබගේ ජීවිතයට දිව්‍යම මග පෙන්වීම ලබා දෙමින් ස්ථිර සාමය හා ප්‍රිතිය ඒවා ඔබට ගෙන දෙන්නේය.

මෝර්මන්ගේ ග්‍රන්ථයඃ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ තවත් ගිවිසුමකි. පිටපතක් නොමිලේ ලබාගැනීමට පහත සඳහන් අන්තර් ජාලයට පැමිණෙන්න නැතහොත් ලියන්න.

**යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ**

පසුදවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාව

www.mormon.org

© 2005 Intellectual Reserve, Inc.
සියලු හිමිකම් ඇවිරිනි. ශ්‍රී ලංකාවේ මුද්‍රණය කරන ලදි

ඉංග්‍රිසි අනුමැතිය 2/05. පරිවර්තන අනුමැතිය 2/05
*The Testimony of the Prophet Joseph Smith*
Sinhala

ඉදිරිපස කවරයේ චිත්‍රය: *ජෝසෆ් සොහොයුරා,* ඩේවිඩ් ලින්ඩ්ස්ලි විසිනි.
පිටුපස කවරයේ චිත්‍රය: *ඒතුමා නැවත නැගිටුන විස්තරය,* ඩෙල් පාසන් විසිනි.

SINHALA
4 02326 67408 6
32667 408

# අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත්ගේ සාක්ෂිය

---

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසුදවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාව



## ජෝශප් ස්මිත් තුමාඃ දෙවියන් වහන්සේගේ අනාගතවක්තෘවරයෙකි.

ජෝශප් ස්මිත් තුමාට වයස අවුරුදු දහ හතරක් වන විට, කුමණ සභාවකට බැදිය යුතුද, කියා දැන ගැනීමට අවශ්‍ය විය. එබැවින් දෙවියන් වහන්සේට අවංක යාච්ඤාව කර ඇසුවේය. මෙම යාච්ඤාවට පිළිතුරු වශයෙන්, පියාණන් වූ දෙවියන් වහන්සේ හා එතුමාගේ පුත් යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ජෝශෆ්ට දර්ශනය වූ සේක. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සත්‍යයේ සභාව පොලවේ නොමැති බවත් එය නැවත පිහිටු වීමට ඔවුන් ජෝශෆ් තෝරාගෙන ඇති බවත් කී සේක.

එදින පටන් ජෝශෆ් දෙවියන් වහන්සේට සේවය කිරීමට වෙහෙසෙමින් යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පසු දවස් වල ශුද්ධවරයන්ගෙන් යුත් සභාව පිහිටුවීමටත් පසු දවස් වලදී දෙවියන් වහන්සේගේ රාජ්‍ය පොළවෙහි ගොඩනැගීමටත් කටයුතු කළේය. ලෝකයේ ගැලවුම් කාරයාණන් හා මිදුම්කාරයාණන් වනාහි යේසුස් ක්‍රිස්තුස්වහන්සේ බව සභාවේ ඇදහිලි වන්ත සාමාජිකයෝ සාක්ෂි දරති. පොළවේ වෙසෙන අනාගතවක්තෘවරයාට එළිදරව් කිරිම් මගින්, යේසුස් වහන්සේ එතුමාගේ සභාව මෙහෙයවන සේක. ජෝශෆ් ස්මිත් තුමා එවැනි අනාගත වක්තෘවරයෙකි. ජෝශෆ් තුමා ඔහුගේ ජීවිත කාලයේදී බොහෝ දේ ඉෂ්ඨ කළ නමුත්, ඉතාම වැදගත් වන්නේ, යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ගෝලයෙක් හා සාක්ෂිකරුවෙක් වශයෙන් කැපවීමය ඔහු මෙසේ ලීවේය. “එතුමා ගැන දෙන ලද බොහෝ සාක්ෂි වලට පසු එතුමා ගැන අප විසින් දෙන ලද මෙම අන්තිම සාක්ෂිය නම්ඃ එතුමා ජීවත් වනසේක” (දහම හා ගිවිසුම 76:22).

අනාගත වක්තෘවරයාගේ සාක්ෂිය, ශුද්ධාත්මයණෙන් වහන්සේගේ බලය මගින් ලබාගත් අය, එම කාර්ය ඉටුකිරිමට ඔහුට ලැබුනු කැදවීම සත්‍ය බව දැනගන්නෝය. ජෝශෆ් ස්මිත් තුමා වන්දනා කරමින් සේවය කළ ගැලවුම්කරුවාණන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුලින් ලැබෙන ප්‍රිතිය හා සාමය ගැන ඔවුන්ට දැන ගැනිමට හැකිවේ.



කුමණ සභාවකට සම්බන්ධ විය යුතුද කියා තීරණය කරගැනීමේදි, මගපෙන්වීම පිණිස ජෝසෆ් තුමා බයිබලයට යොමු විය. දෙවියන් වහන්සේගෙන් අහන්න කියා එහිදි ඔහු කියෙව්වේය.

## කුමණ සභාවක් හරිද?

වර්මොන්ට් ෂැරෝන් නම් නුවර 1805 දී ජෝශෆ් ස්මිත් තුමා උපත ලැබුවේය. මෙම කතාන්තරය පටන් ගන්නා විට ඔහුගේ වයස අවුරුදු 14 කි. නිව්යොක් ප්‍රාන්තයේ තම පවුල සමග ජීවත් වන අතර කුමන සභාවකට බැදෙනවාද යන්න ලැන උනන්දුවෙන් හා සැලකිලිමත්ව සිටියේය. තමාගේ වචනයෙන් ලියන ලද ජෝශෆ් තුමාගේ අත්දැකීම්, පහත සදහන් වේ.

බොහෝ පෙළඹවීම් ඇති වු මෙම කාළය තුලදී මගේ මනස වැදගත් මෙනහි කිරීම් වලට යොමුවුන අතර බොහෝ අපහසුතාවයකට පත්විය. බොහෝ විට මටම මා මෙසේ කියා ගන්නවාඃ මොනවා කරන්නද? මෙම පක්ෂ අතරින් හරි කුමක්දඃ නැතහෝත් ඔවුන් සියල්ලෝම වැරදිද?

ඔවුන් එක්කෙනෙක්වත් හරි නම් එය කුමක්ද, මා එය දනගන්නේ කෙසේද?

මෙම ආගමික පක්ෂ තුල තිබෙන වාද භේද නිසා මා ඉතාමත් දුෂ්කර තත්වයකට පත්ව වෙහෙස වී සිටින අවස්ථාවක දිනක් යාකොබ්ගේ සංදේශයේ පලවෙනි පරිච්ඡේදයේ පස්වෙනි පදය කියෙව්වෙමි. එය මෙසේ කියවෙයිඃ "නුමුත් නුඹලාගෙන් යමෙකුට ප්‍රඥුව අඩු නම්, වරද නොතබන්නාවූ බොහෝකොට සියල්ලන්ට දෙන්නාවූ දෙවියන් වහන්සේගෙන් ඔහු ඉල්ලුවා එවිට ඔහුට එය දෙනු ලැබේ."

ශුද්ධ වූ ලියවිලි කොටස්, කිසි කලෙක මිනිසාගේ හදවතට වැඩි බලයකින් පැමිණියාය. එය මහත් ශක්තියකින් යුතුව මගේ හදවතේ හැම හැගිමකට ඇතුලුවූ බව පෙනුනි මම නැවත නැවතත් ඒ ගැන මෙනෙහි කළෙමි. යම් පුද්ගලයෙකුට දෙවියන් වහන්සේගේ ප්‍රඥාව අවශ්‍ය වී නම් මට එය අවශ්‍ය බවද, විවිධ නිකායන්හි ආගම පිළිබඳ ගුරුවරුන් විසින් එකම ශුද්ධ වූ ලියවිලි කොටස, වෙනස් විදියකට තේරුම් ගත් බැවින්, ප්‍රශ්නය බයිබලයට යොමු කිරිමෙන් විසදා ගැනිමේ විශ්වාසය විනාශවිය.

අවසානයේදි මම තීරණයකට පැමිණියෙමි. "අඳුරෙහි හා ව්‍යාකුල තත්වනක සිටිය යුතුය.



නැතහොත් යාකෝබ්තුමා මග පෙන්වන ලෙස ක්‍රියාකළ යුතුය. බීනම් දෙවියන් වහන්සේගෙන් ඉල්ලා සිටිමය, යන නිගමනයට පැමිණියෙමි." උන්වහන්සේ ප්‍රඥාව අඩු අයට නොමසුරුව, දොස් නෙතබා ප්‍රඥාව දෙන්නේ නම්, මාද එය ක්‍රියාත්මක කිරිමට තිරණය කරමින්, දෙවියන් වහන්සේගෙන් ඉල්ලා සිටිමට අධිෂ්ඨාණ කරගනිමි.

## ජෝශෆ් ස්මිත් තුමාගේ පළමු දර්ශනය

එබැවින් දෙවියන් වහන්සේගෙන් ඇසිමේ අධිෂ්ඨානය අනුව, උත්සාහ කර බැලීම සඳහා මම කැලයට ගියෙමි. එය වෂි එකදාස් අටසියවිස්සේ වසන්ත කාලයේ මුල් භාගයේ පැහැදිලි අලංකාර උදැසනකි. එය මාගේ ජීවිතයෙහි එබඳු උත්සාහයක් කල පළමු අවස්ථාව විය. මගේ සියලු මහත් ආශාවන් මැද උවද, මෙතෙක් කිසි දිනක වාචිකව යාච්ඤා කිරිමට උත්සාහ නොදැරුවෙමි.

*මේ මගේ ප්‍රේමවන්ත පුත්‍රයාය, ඔහුට සවන් දෙන්න — එක්කෙනෙක් අනිත් තැනැත්තාට පෙන්වා එසේ කිවේය.*

මම කලින් සැලසුම් කරගත් ස්ථානයට ගිය පසු අවට බලා හුදකලාව සිටින බව දැන දණගසා මාගේ සිත් තුල තිබුන අභිලාශයන් දෙවියන් වහන්සේට ඉදිරිපත් කිරීමට පටන් ගතිමි. එසේ කොට අවසන් වූ සැනින්ම කිසියම් බලයකින් මා අල්ලා සම්පූර්ණයෙන් යටපත් කරන අතර, කථා කිරීමට නොහැකි ලෙස දිව බැද දැමීමට තරම් මවිත කරන බලයක් විය. ඝන අන්ධකාරයක් මා වටා විය. ඒ අවස්ථාවේ මා ක්ෂනික විනාශයකට තීරණය වූ ලෙස පෙනිගියේය.

මා අත්පත් කරගෙන සිටින මෙම සතුරාගේ බලයෙන් මුදවා ගැනීම පිණිස, දෙවියන් වහන්සේට යාච්ඤා කිරිම සඳහා මගේ සියළු බලය එක්තැන් කරන අතර, එම මොහොතේම බලාපොරොත්තු රහිත බවේ ගිලී, මා විනාශවීමට ඉඩදිමට සූදානම් උනෙමි... මනඃකල්පිත විනාශයකට නොව මා විසින්



මින් පෙර කිසිම ජීවයක් තුල නොහැගෙන පුදුමාකාර බලයක් ඇති නොඑසේ නම් අද්භූත බලයක් ඇති නොපෙනෙන ලොවකින් පැමිණි යම් ජීවයකුගේ සත්‍ය බලයකටය. මෙම මහත් බිය ජනක මොහොතේ, හිරුගේ දීප්තිය ඉක්මවූ ඇලෝක ස්ථම්භයක් මාගේ හිසට උඩින් දුටුවෙමි. එය මා මත පතිත වන තුරු ක්‍රමයෙන් පහත් විය.

එය දර්ශනය වූ විගස, මා බැඳ සිටි සතුරාගෙන් නිදහස් වූ බව මම වටහා ගතිමි. ආලෝකය මා මත පතිත වූ පසු ආකාශයේ මට ඉහලින් සිටින විශිෂ්ඨ පුද්ගලයන් දෙදෙනෙකු දුටිමි. ඔවුන්ගේ දිප්තිය හා මහිමය වර්ණනාව ඉක්මවා ඇත. ඔවුන්ගෙන් කෙනෙක්, මගේ නම කියා කථා කොට, අනෙක් තැනැත්තාට පෙන්වා— මේ මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාය. ඔහුට සවන් දෙන්න යයි කීවේය.

මගේ අරමුණ වුයේ කුමකටද සම්බන්ධවීමටදැයි දැන ගනු පිණිස, සියළු නිකායන් අතරින් කවරක් නිවැරදි දැයි දැන ගැනීම සඳහා ස්වාමින් වහන්සේගෙන් විමසීමය. පියවි තත්වයට පත්ව කථා කිරීමට හැකිවූ විගස, ආලෝකයෙහි මට ඉහලින් සිටින විශිෂ්ඨ පුද්ගලයාගෙන් සියළු නිකායන් අතරින් කවර නිකායකට මා සම්බන්ධ විය යුතුදැයි ඇසුවෙමි.

ඒ සියල්ල වැරදි වරදි සහගත බැවින් එකකටවත් මා සම්බන්ධ නොවිය යුතුයයි පිළිතුරු ලැබුනි මා ඇමතු එම විශිෂ්ඨ පුද්ගලයා, ඔවුන්ගේ සියළු ඇදහිලි, ඔහු ඉදිරියේ පිළිකුලක් බවත්, ඒ සියලු මහාචාර්යවරුන් දුෂනයෙන් යුතු බවත් කිවේය. "ඔවුහු ඔවුනගේ වචනයෙන් මට සමීප වු නමුත් හඳවත් මා කෙරෙන් දුරස්ථය. දේවත්වයෙන් යුතුව මිනිසුන්ගේ පණත් හා ධර්ම උගන්වති. එහෙත් එහි බලයක් නැතැයි කියති."

නැවතත් ඒ කිසිවකට සම්බන්ධ වීම මට තහනම් කළේය: ඔහු තවත් බොහෝ දේ මට පවසන ලදි,මේ අවස්ථාවේ මට ඒවා ලිවීමට නොහැකිය. මම මගේ ප්‍රකෘති තත්වයට පැමිණි විට, අහස දෙස බලමින් මා බිම වැතිර සිටියෙමි. ආළෝකය නැතිව ගියේය. ඒ සමගම මගේ ශක්තියද නැතිව ගිය නමුත්, ස්වල්ප වේලාවකට පසු සැහෙන පමණ ප්‍රකෘති තත්වයට පැමිණි පසු ගෙදර ගියෙමි.

## හිංසාපීඩා

*ජෝශප් තුමා දෙවියන් වහන්සේට කීකරු වී එවකට පැවතුන වෙනත් සභාවකට සම්බන්ධ නොවීය. ඔහු දැකපු දෙය හා ඇසුන දෙය ජනයාට කී විට, විරුද්ධකම් හා හිංසාපීඩා අත්දැකීමට පටන් ගත්තේය.*

මා මෙම කතාව කීවාට පසු බොහෝ ආගමික කොටස් කලබලයට පත්වී. මට හිංසාපීඩා කිරීමට පටන්ගත්තේය. තදබල හිංසාපීඩා වැඩිවෙමින් පැවතුනේය. අවුරුදු දහ හතරටත් පහලොවටත්

අතර වයසැති මා ගැන කිසිවෙකු නොදන්න බැවින්ද ලෝකයේ කිසිම වැදගත්කමක් නැති පිරිමි ළමයෙක් වු මාගේ ජීවිතයේ තත්වය මෙසේ තිබුනත්, උසස් තත්වයේ සිටි ජනයා, මහ ජනතාවගේ සිත් මට විරුද්ධව පෙළඹවීමටත් කටුක හිංසාපීඩා කරමින් අනිකුත් සියළුම නිකායවල අය මට හිංසාපීඩා කිරීමට එකමුතු වුහ.

එවිටද, ඊටපසු බෝහෝ විටද, වයස දහහතර මඳක් ඉක්මවූ, ඉතා වෙහෙස මහන්සියෙන්, බොහෝ පිරිමැස්මෙන් එදිනෙදා ජීවිතය ගෙනයන සාමාන්‍ය පිරිමි ළමයෙකු, එදින ඉතා ජනප්‍රිය නිකායන්හි උසස් පුද්ගලයන්ගේ අවධානය යොමු කිරීමට තරම් ප්‍රමාණවත් වැදගත් කමකින් යුතු චරිතයක් ලෙස සිතිමට ඉතා කටුක හිංසාවන් කිරීමේ හා ගැරහීමේ ආකල්පය ඔවුන් තුල ඇතිවු අන්දම කොතරම් පුදුම සහගතදැයි කියා මා ඉතා ගැඹුරු ලෙස කල්පනා කළෙමි. පුදුම උවත් නැතුවත් එය එසේ විය. බෙහෝ විට මා ඒ ගැන මහත් ශෝකයට පත්විය.

කෙසේ වුවත් මා දර්ශනය දුටුබව සත්‍යයකි. එතැන් සිට මා බොහෝ සෙයින් පවුල් තුමා ලෙස හැඟුනු ව සිතමි. ඔහු අග්‍රිපා රජු ඉදිරියේ නිදහසට කරුණු ඉදිරිපත් කිරීමේදී තමා ආලෝකයක් දුටුවිට හා කටහඬක් ඇසුවිට ඇතිවු දර්ශනය විස්තර කිරීමේදී එය විශ්වාස කළ ස්වල්ප දෙනෙක් විය. සමහරෙක් ඔහු වංචාකාරයෙක්ද, තවත් සමහරු ඔහු උන්මත්තෙකු යයිද කීහ. ඕහු සිනහවට හා ගැරහිමට භජනය විය. නමුත් මේ සියල්ල ඔහු දුටු දර්ශනය සත්‍යතාවය විනාශ කලේ නැත.ඔහු දර්ශනයක් දුටුවේය. එය ඔහු දැන සිටියේය. ස්වර්ගයට ඇති සියළුම හිංසා වලින් එය වෙනස් කල නොහැකිය. මරණය දක්වා ඔහුට හිංසා කලත්, අවසන් හුස්ම දක්වා තමා ආලෝකය දුටු බවත්, ඔහුට කතා කරන හඬක් ඇසුන බවත් ඔහු දැන සිටියේය. ඔහුගේ සිතුම් හෝ විස්වාසය වෙනස් කිරීමට මුළු ලොවටම නොහැකිය.

මටද එසේමය. මම සැබවින්ම ආලෝකයක් දුටුවෙමි. එම ආලෝකය මැද විශිෂ්ඨ පුද්ගලයන් දෙදෙනෙකු දුටුමි. ඔහුවු සැබවින් මා සමග කථා කලහ. මා දර්ශනයක් දුටුබ ව කී නිසා මට වෛර කලත් හිංසා කලත් එය සත්‍යයකි. එසේ කී නිසා ඔවුන් මට හිංසා කරත්දී, ගරහද්දී, මට විරුද්ධව නොයෙක් නපුරු දේ හා අසත්‍ය දේවල් කියද්දී, මා හදවතින් මෙලෙස කියා ගත්තෙමි. සත්‍ය කියන නිසා මට හිංසා කරන්නේ මන්ද? සැවින් මම දර්ශනයක් දුටුවෙමි. දෙවියන් වහන්සේට යටත් නොවී සිටිය හැකි මා කවරෙක්ද? මා සැවින්ම දර්ශනයක් දුටු ව නැතැයි කියවීමට ලෝකයා සිතන්නේ මන්ද? මා දර්ශනයක් දුටු බැවින් මා එය දනිමි. දෙවියන් වහන්සේ එය දන්නාබ ව මම දැන සිටිමි. මට එය නැතැයි කිව නොහැකිය. මා එසේ කිරීමට නිර්භය වන්නේ නැත. එසේ කිරීමෙන් මම දෙවියන් වහන්සේට වරදක් කරන බවද, ප්‍රතික්ෂේපයට ලක්වන බවද දැන සිටියෙමි.

> *මම දර්ශනයක් දුටුමි මම එය දැන සිටිමි, දෙවියන් වහන්සේ දැන සිටියා, මට එය ප්‍රතික්ෂේප කිරීමට නොහැකිය. මා එසේ කීමට නිර්භය වන්නේද නැත.*

මගේ මනස ලද දෙයින් සතුටු වෙයි. නිකායක ලෝකයෙන් ඈත්ව — ඒවායින් කිසිවකට බැඳිම මගේ යුතුකම නොවේ. තවදුරටත් උපදෙස් ලැබෙනතුරු මේ අන්දමින් කටයුතු කරගෙන යමි. යාකොබ්ගේ සාක්ෂිය සත්‍ය බව මම සොයාගත්තෙමි. — එනම් ප්‍රඥාව අඩු මිනිසෙකුට දෙවියන් වහන්සේගෙන් ඉල්ලීමට හැකි බවත්, එය ඔහු දොස් පවරන්නේ නැතිව ලබන බවත්ය.

මා දර්ශනයක් දුටුබව තහවුරු කිරීම දිගටම කළේය. එබැවින් ආගමික ලැදියාවක් ඇතිවුද, නැතිවුද, සියළු පන්තිවල මිනිසුන්ගෙන් ලද කටුක හිංසා වලින් මුළු කාලය තුලම පෙළෙමින් සිටියෙමි. එක්දහස් අටසිය විසිතුනේ සැප්තැම්බර් විසිඑක්වන දින දක්වා, මම මගේ සාමාන්‍ය රැකියාවන් කරගෙන ගියෙමි.

මා දර්ශනය දුටු කාලයේ සිට එකදහස් අටසිය විසිතුන දක්වා කාලය අතරතුරදී, කිසිම ආගමික නිකායකට නොබැඳුනෙමි. එය මට තහනම් කරන

ලදී. නොමේරු තරුණ වයසෙහි සිටි මා මගේ මිතුරන් විය යුතුවුද, මම කරුණාවෙන් සැළකිය යුතුවද, මා මුලාවී ඇතැයි සිතුවාහු නම්, යෝග්‍ය සහ දයාන්විත ආකාරයකින් මා මුදා ගැනිමට උත්සාහ කළයුතුවුද අය විසින් හිංසා කරනු ලැබු මම සියළු ආකාරයේ පෙළඹීම් වලට භාජනය වීමි. සියළු වර්ග වල සමාජ සමග මිශ්‍ර වෙමින් නිතර බොහෝ අඥාන වැරදි වලට වැටුනු අතර, තරුණ වියේ දෝෂයන්ද මිනිස් බවේ දුර්වලකම්ද විදහා දැක්විමි. දෙවියන් වහන්සේ ඉදිරියෙහි වරද සහගත වන අනේක පෙළඹීම් වලට භාජනය වු බව කීමට මම කනගාටු වෙමි. මේ පාපොච්චාරනය කිරීම නිසා මා ඉතා උග්‍ර පාපයන් කිසිවකට වරදකරුයයි කිසිවෙකුට සිතිමට උවමනා නැත. එවැන්නක් කිරීමට සිතිම මගේ ස්වභාවය නොවීය. මා මෙම කීවාට පසු බොහෝ ආගමික මාහාචාර්යවරුන් කලබලයට පත්වී, මට හිංසාපීඩා සිතිම මගේ ස්වභාවය නොවීය.



ජෝසෆ් ස්මිත් තුමාගේ පළවෙනි දර්ශනයෙන් වර්ෂ තුනකට පසු යේසුස් වහන්සේගේ ශුභාරංචිය නැවත පිහිටුවීම සඳහා උපදෙස් දීමට මොරෝනයි දේවදුතයා දෙවියන්වහන්සේ එවුසේක.

## මොරෝනයිගේ බැහැදැකීම

*ජෝසෆ් තුමා දෙවියන් වහන්සේ දුටු බව ප්‍රතික්ෂේප නොකල නිසා දිගටම හිංසාපීඩා වලට භාජනය විය. 1823 සැප්තැම්බර් මස 21 වෙනි දින යහනට ගිය ජෝසෆ් තුමා ස්වාමීන් වහන්සේ ඉදිරියෙහි ඔහුගේ තත්වය දැනගැනිම සඳහා යාච්ඤා කළේය. මොරෝනයි දේවදුතයා ඔහුට දර්ශනය විය*

ඉහත සදහන් කළ සැප්තැම්බර් මස විසිඑක්වන දින සැන්දෑවේ, යහනට ගිය මා සර්වපරාක්‍රම දෙවියන් වහන්සේට ආයාචනා කරමින් යාච්ඤාවෙහි යෙදුනෙමි. මා කළ සියළු පාපවලට හා අනුවණ ක්‍රියාවලට සමාව ලබාගැනීමටත්, එතුමා ඉදිරියේ මාගේ තත්වය ගැන දේව ප්‍රත්‍යක්ෂ කිරීමක් ලබා ගැනීමටත්, පළමුව ලැබුවා මෙන් දේව ප්‍රත්‍යක්ෂ කිරීමක් ලැබෙන බවට සම්පුර්ණ විශ්වාසයක් මා තුල තිබෙන බැවින්ය.

"මෙසේ මා දෙවියන් වහන්සේට භක්තිමත්ව යාච්ඤාවෙහි සිටින විට, මගේ කුටියේ දිස්වන ආලෝකයේ දුටිමි. එම ආලෝකය වැඩි වී මධ්‍යහනයටත් වඩා මගේ කුටිය එළිය විය. එවිටම මගේ ඇඳ ලඟ එක් පුද්ලගයෙක් දර්ශනය විය. ඔහුගේ පා බිම නොගැවුනු නිසා ඔහු හිටගෙන සිටියේ වායුවෙහිය.

ඔහු ලිහිල් හා විශිෂ්ඨ ධවලවර්ණ සලුවක් ඇගලා සිටියේය. එසේම, මෙලොව යමක් මෙතරම් මහත් සේ ධවලවර්ණ හා කාන්තිමත් ලෙස දැක්වීමට හැකිවෙතැයි මම විශ්වාසනොකරමි. ඔහුගේ අත් හා මැණික් කටුව දක්වා බාහුද නග්නව තිබුනි. ඔහුගේ කුකුල්ද වළලුකරට ස්වල්පයක් ඉහල දක්වා නග්නවිය. ඔහු මේ සළුව හැර වෙන වස්ත්‍රයක් පැළඳ නොසිටි බව මට සොයාගැනීමට හැකිවිය. මන්දයත් ඔහුගේ පපුව පෙනෙන තෙක් එය විවෘනව තිබු බැවිනි.


මහත්සේ ධවලවර්ණ වුයේ ඔහුගේ සළුව පමණක් නොවේ. ඔහුගේ සම්පුර්ණ ශරීරය කියා නිමකල නොහැකි තරම් තේජවන්ත විය. ඔහුගේ මුහුණ ඇත්තෙන්ම අකුණු සැර වදින්නාක් මෙන් විය. කුටිය මහත් සේ ආලෝකමත් විය, එහෙත්

ඔහුගේ ශරීරය අවට මෙන්ම ආලෝකමත් නොවිය. මා පළමු වතාවට ඔහු කෙරෙහි නෙත් යොමු කල විට තැතිගත් නමුදු, මේ බිය ඉක්මනින් තුරන් වී ගියේය.

ඔහු මගේ නමකියා කථාකොට, තමා දේව සම්මුඛයෙන් මා වෙත එවන ලද පණිවුඩකරුවකු බවද, ඔහුගේ නම මොරෝනයි බවද, දෙවියන් වහන්සේට මා ලවා කරවීමට කාර්‍යයක් ඇති බවද, මගේ නම සියළු ජනයන්, වංශයන් හා භාෂාවන් අතර යහපතට හා අයහපතට යෙදෙන බවද සියළු ජාතීන් අතර එහි යහපත හා අයහපත දෙකම කථා වෙන බව මට පැවසිය.

මේ මහත් මහද්වීපයේ පෙර විසූවන්ගේ ඉතිහාසය, ඔවුන් පැවත එන ප්‍රභවය දක්වන රන් තහඩු මත ලියන ලද පොතක් තැන්පත් කර ඇති බව ඔහු කීවේය. ගැලවුම්කරුවාණන් විසින් පැරණි වැසියන්ට කියා දෙන ලද සදාකාලික සුභාරංචියේ පූර්ණත්වය එහි අඩංගු වී ඇති බව ඔහු කීවේය.

"තවද රිදී දුනුවල ගල් කට දෙකක් ඇති බවද—මේ ගල් සවිකරන ලද කවචය යුරිම් හා තුම්මිම්—යන නමින් හැඳින්වෙන බවද, ඒවා තහඩු සමග තැන්පත් කර ඇති බවද පුරාණ කාලයේ නොහොත් පූර්වයේදී මේ ගල් කැට අයිතිය හා භාවිතය අනාගත වක්තෘවරු සතු බවත් එම පොත් පරිවර්තනය කිරීම සඳහා දෙවියන්වහන්සේ ඔවුන් සූදානම් කල බවත් ඔහු පැවසිය.



වර්ෂයේදී අනාගතවක්තෘ මොරෝනයිතුමා තම ජනතාවගේ ශුද්ධ වු වාර්තා කුමොරො කන්දෙහි වැළලුවේය. පසුව උත්ථානවු භාවයකින් නැවත පැමිණ, පැරණි වාර්තා ගැන ජෝසප් ස්මිත් තුමාට කීවේය. ඇමරිකා මහද්වීපයේ පැරණි වැසියන්ට ගැලවුම්කාරයාණන් වහන්සේ දුන් සම්පූර්ණ ශුභරංචිය එහි අඩංගුවන බව කීවේය. මොර්මන්ගේ පොත එම වාර්තාව වේ.

මෙම්වා මට කීවාට පසු පරණ ගිවිසුමෙන් අනාවැකි උපුටා දැක්වීමට ඔහු පටන් ගත්තේය. පළමුව ඔහු මලාකී පොතෙන් තුන්වෙනි පරිච්ජේදයෙන් කොටසක්ද; එම අනාවැකියෙන්ම හතරවෙනි හෝ අන්තිම පරිච්ජේදයද, අපගේ බයිබලයේ කියවන අන්දමට මඳක් වෙනස් කොට දක්වන ලදී. එහි කියවෙන අන්දමට පළමුවන පදය උපුටා ගන්නවා වෙනුවට ඔහු මෙසේ උපුටා දක්වයි:

"බලව, උදුනක් මෙන් ඇවිලෙන දවස පැමිණෙන්නේය. එවිට සියළු උඩගු අයද දුෂ්ඨකම් කරන සියල්ලද ඉපනැලි වී, ඔහුන්ට මුලක් වත් අත්තක්වත් නොවන හැටියට," ඇවිලෙන්නේයයි සෙනගගේ ස්වාමින් වහන්සේ කියන සේක.

ඔහු නැවතත් පළවෙනි පදය මෙසේ උපුටා දැක්වුවේය "බලව ස්වාමින්වහන්සේගේ මහත්වූ භයානක දවස පැමිණෙන්ට පළමුවෙන් ප්‍රොපේතවූ එලියා මගින් පූජකවරය රළිදරව් කරමි."

ඊලග පදය වෙනස් අන්දමට ඔහු දැක්විය. මා ඇවිත් ශාපයකින් දේශයට පහර නොදෙන පිණිස ඔහු පියවරුන්ගේ සිත් දරුවන් වෙතට දරුවන්ගේ සිත් පියවරුන් වෙතට හරවන්නේය.

මෙයට අමතර යෙසායා එකොලොස් වෙනි පරිච්ජේදය උපුටා දක්වමින් එය සම්පූර්ණව ඉෂ්ඨ වීමට ඉතා ආසන්න බව කීවේය. ක්‍රියා පොතේ තුන්වෙනි පරිච්ජේදයේ විසිදෙවෙනි හා විසිතුන්වෙනි පද, අලුත් ගිවිසුමේ සඳහන් පරිදිම, ඔහු උපුටා

දක්වන ලදී. අනාගතවක්තෘවරයා ක්‍රිස්තුස්වහන්සේ බවත්, එතුමාගේ හඬට සවන් නොදෙන අය ජනයා අතරින් කපා හරින බවත්, එම දිනය තවම පැමිණ නැති බවත්, නමුත් ලඟදීම එය පැමිණෙන බවත් ඔහු කීවේය.

යොවෙල්ගේ පොතේ දෙවෙනි පරිච්ඡේදයේ විසි අටවෙනි පදයේ සිට අන්තිම දක්වා ඔහු උපුටා දැක්වුයේය. මෙය තව ඉෂ්ඨ වී නැත, නමුත් ලඟදීම එසේ වන බව ඔහු කිවේය. තවද අන්‍යජාතීන්ගේ සම්පූර්ණත්වයේ ලඟදීම පැමිණෙන්නේය. තවත් බොහෝ ශුද්ධ ලියවිලි කොටස්, උපුටා දැක්වූ අතර බොහෝ විස්තරද ඉදිරිපත් කළ නමුත් එහිදී එය සදහන් කිරිමට නොහැකිය.

*මගේ මනසට දර්ශනය විවෘත විය, තහඩු තැන්පත් කළ ස්ථානය මට දැනගැනීමට හැකි විය.*

“නැවත, ඔහු විසින් විස්තර කරන ලද මෙම තහඩු මා ලබා ගත් විට — මන්දයත් ඒවා ලබා ගතයුතු කාලයත් තවම සම්පූර්ණ වී නොමැත— ඒවා හෝ යුරිත් හා තුම්මිම් සමග හෝ කවචය හෝ, ඒවා පෙන්වීමට මට අනලැබෙන පුද්ගලයන්ට හැර වෙන අයෙකුට නොපෙන්විය යුතු බවද, මා එසේ කලේ නම් මා විනාශ විය යුතු බවද ඔහු මා සමග කිවේය. ඔශු තහඩුව ගැන මා සමග කථා කරමින් සිටි විට, එම තහඩු තැන්පත් කර තිබු ස්ථානය මට පෙනෙනසේ දර්ශනය මගේ මනසට විවෘත කරන ලදී. එය කොතරම් පැහැදිලිද යත් මා එය ගියවිට එම ස්ථානය දැනසිටියෙමි.

මෙම ප්‍රකාශනයෙන් පසු, කුටිය තුල වූ ආලෝකය මා සමග කථා කරමින් සිටි අයගේ ශරීරය අවට එක්රැස් වනු දුටිමි. මෙසේ ඔහුගේ ශරීරය සමීපය හැර කුටිය අඳුරු වෙන තෙක් ආලෝකය හීන වී ගියේය. ක්ෂණයකින්ම ස්වර්ග දක්වා විවෘතවූ ප්‍රණාලියකින් මෙන් ඔහු නැගිට ගොස් නොපෙනී ගියෙන් කුටියද ස්වර්ගීය ආලෝකය දිස්වීමට මත්තෙන් තිබුනා සේ විය.

මා දර්ශනය පුදුමය ගැන කල්පනා කරමින්ද එම අත්භූත පණිවුඩකරු මා සමග පැවසු කරුණු ගැන මවිතවෙමින්ද සිටින විට මාගේ ධ්‍යානය අතරතුරදී මගේ ඇඳ අසල විය.

“ඔහු මා අමතා, පළමු පැමිණීමේදී කලාක් මෙන් ස්වල්පයකුදු වෙනස් නොකොට, එම කරුණුම ප්‍රකාශ කළේය. ඉන්පසු මෙලොවට පැමිණීමට යන සාගත යුද්ධ හා දරුණු රෝග ඇතුලත් මහත් විපත් සමග දේව උදහසින් ලැබෙන දඬුවම් ගැනද ඔහු මට දැනුම් දුන්නේය. තවද මේ භයංකාර දඬුවම් මේ පරම්පරාව තුලදීම ලොවට ලැබෙන බව ඔහු කීවේය මේ කරුණු පහදා දුන් පසු පෙරමෙන් නැවතද අහසට නැගී ගියේය.



*නිව්යෝක් නගරයේ පැල්මයිරාහි ස්මිත් ගොවිපලට දකුණු පසින් සැතපුම් තුනක් පමණ ඇතින් නියුමෝරා කන්ද පිහිටා තිබුනේය. ජෝසෆ් තුමාගේ කාලයේ හ්වා උතුරු කොටස තණකොල වලින් වැසි තිබුණි. දකුණු පස ගස්වලින් වනයෙන් යුක්ත විය මුදුනට නුදුරින් දකුණු බටහිර පැත්තේ තහඩු වළලා තිබුනි. පිංතුරය අගෝස්තු 1907.*

මේ වන විට මගේ සිතෙහි ඇතිවී ගිය හැගීම් කොතරම් ගැඹුරු වීද, යත්. මගේ දෑසින් නින්ද පහවී ගොස් තිබුනි. මා දුටුදෙයින් හා ඇසු දෙයින් හටගත් පුදුමයෙන් මා යටපත් වී සිටියෙමි: නැවතද මගේ ඇඳ අද්දර එම පණිවිඩකරුම දැක, පෙරසේ එම කරුණුම මට නැවත පහදා දුන් විට මට ඇතිවූ පුදුමය මහත් විය. තහඩු ලබාගෙන ධනවත් වීමට (මගේ පියාගේ පවුල අසරණ තත්වයක සිටිමේ ප්‍රතිඵලයක් වශයෙන්) සාතන් මා පරීක්ෂා කිරීමට උත්සාහ කරතැයිද ඔහු මට අවවාද කළේය. තහඩු ලබාගැනිමේ අරමුණ විය යුත්තේ දෙවියන්වහන්සේට ප්‍රශංසා කිරීමට විනා වෙන කරුණක් නොවිය යුතුයයිද කියමින් ඔහුමට එය තහනම් කළේය.

උන්වහන්සේගේ රාජ්‍යය ගොඩනැගීමේ අදහස හැර වෙනයම් කරුණක් විසින් මා නොනැසිය යුතුයයිද, නැතහොත් ඒ තහඩු මට ලබාගත නොහැකිවන්නේ යයිද ඔහු මා සමග කීවේය.

මේ තුන්වැනි පැමිණීමට පසු පෙර ඔහු නැවතත් ස්වර්ගයට නැගී ගියෙන් මා අත්දුටු කරුණු බව



අවුරුදු පතා අවුරුදු හතරක්මමොරෝනයි නැවත පැමිණ තරුණ අනාගතවක්තෘවරයාට තවත් උපදෙස් ලබාදුන්නේය. අවුරුදු හතරක් අවසාන වූ විට ජෝසෆ් තුමාට තහඩු ලැබී මොර්මන්ගේ ග්‍රන්ථය පරිවර්තනය කිරිම ආරම්භ විය.

පුදුම සහගත දේ ගැන මෙනෙහි කිරීමට අවස්ථාවක් පැමිණියේය. එහෙත් ස්වර්ගිය පණිවිඩකරු මා කෙරෙන් තුන්වැනි වරට නැගිගිය සැනෙකින් කුකුළා හැඬළීය. අරුණෝදය ලග වී ඇති බවද, අප කථාබස් වලින් මුළු රැයම ගෙවී ගොස් ඇති බවද මට එවිට දැනී ගියේය.

සැනෙකින් ඇඳෙන් නැගිට මා අවශ්‍ය වැඩකටයුතු සඳහා ගියෙමි. නමුත් වෙනදා මෙන් නොව, වැඩක් කිරීමට උත්සාහ කරන විට මාගේ ශක්තිය හීන වී ගොස් ඇති බව මට දැනුණි. මා සමග වැඩ කරමින් සිටි මගේ පියා මා කෙරෙහි යමක් වැරදී ඇති බව දැන මට ගෙදර යෑමට කීවේය. නිවසට යෑමේ අදහසින්, යෑමට පිටත් වී කුඹුරේ වැටෙන් පැනීමට උත්සාහ කළ විට ශක්තිය නොමැතිව අසරණ වී බිම ඇදගෙන වැටුනෙමි. වේලාවක් ගතවන තුරු සිහිසන් නැතුව සිටියෙමි.

මට මතකයට ආ පළමු කරුණ නම්, මගේ නම අමතා කථාකරන කටහඬකි, මා ඉහල බැලූ විට, පෙරමෙන් ආලෝකයෙන් වටවූ පණිවුඩකරුම මාගේ හිසට ඉහළින් සිටිනු දුටුවෙමි, පෙර දින රාත්‍රියෙහිම මට ප්‍රකාශ කළ කරුණුම නැවත ප්‍රකාශ කර, මගේ පියා වෙත ගොස් මා දුටු දර්ශනය හා පණිත් ගැන ඔහුට කීමට මට අණ කළේය.

මම කීකරු උනෙමි. පියා වෙත නැවත ගොස් සම්පූර්ණ කරුණු ඔහුට කීවෙමි. එය දෙවියන්වහන්සේගෙන් බවත්, පණිවුඩකරු අණ කළ පරිදි ගොස් සියල්ල කරන ලෙසට ඔහු මට පිළිතුරු දුන්නේය. කුඹුරෙන් නික්ම ගිය මම, තහඩු තැන්පත් කර ඇතැයි පණිවුඩකරු මා සමග කී ස්ථානය ටමම ගියෙමි. මට ලැබුණු දර්ශනය කොතරම් පැහැදිලිද කීවොත්, මම එහි පැමිණි මොහොතේම එය හඳුනා ගතිමි.

## ශුද්ධ වූ වාර්ථා

නිවියෝක් ජනපදයේ, ඔන්ටේරියා ප්‍රාන්තයේ මැන්චෙස්ටර් ග්‍රාමයට ලංව අසල ඇති අනිත් කඳුවලට වඩා උස්ව පිහිටි එක් කන්දකි. මේ කන්දේ බටහිර දිසාවේ, කඳු මුදුනේ සිට වඩා ඈත නැති, තරමක් විශාල වූ ගලක් යට, ගලින් නෙලන ලද පෙට්ටියක් තුල එම තහඩු තැන්පත් කර ඇත. මෙම ගලේ ඉහල කොටසේ මැද ගනකමට කවාකාර වී ඇත. කෙළවරට වන විට තුනී වී තිබෙන බැවින්, මැද කොටස පමණක් පොළවෙන් උඩට දිස්වන අතර අග කොටස වටේට පසින් වැසී තිබුනි.

පස් ඉවත් කර ලෙවරයක් ගෙන ගලේ කෙලවර යටින් සවි කොට සුළු වෑයමකින් ගල එසෙව්වෙමි. මම එබී බැලුවිට සැබවින්ම එහි තහඩුද යුරිම්

හා තුම්මිද කවචයද පණිවුඩකරු කී පරිදි එහි තිබුනේය. ඒවා තැන්පත් කල පෙට්ටියේ ගල් එක් රැස් කොට යම් සිමෙන්ති වර්ගයකින් තනන ලදී. පෙට්ටිය පතුලේ කුරුසයක හැඩයට ගල් දෙකක් තබා තිබුනි. එම ගල් මත තහඩු හා අනිකුත් දේවල් තබන ලදි.

ඒවා එළියට ගැනීමට මම උත්සාහ කළ නමුත් පණිවුඩකරු එය තහනම් කළේය ඒවා ගැනීමට කාලය තවම නොපැමිණි බවත්, එතැන් සිට අවුරුදු හතරක් ගතවන තුරු එය නොපැමිණෙන බවද, ඔහු කීවේය. නමුත් එදින සිට අවුරුද්දක් ඉක්ම ගිය විට මා එම ස්ථානයට පැමිණිය යුතු බවද එහිදි මට ඔහු මුණගැසෙන බවද කීවේය. තහඩු ලබාගැනීමේ කාලය පැමිණෙන තෙක් මා එහි පැමිණිය යුතු බවද ඔහු මට කීවේය.

> *මෙම කන්දේ බස්නාහිර පැත්තේ, මුදුනට නුදුරින් විශාල ගලක් යට, ගලින් තනන ලද පෙට්ටියක් තුල ඒ තහඩු තැන්පත් කර තිබුණි.*

එසේ මට අණ කළ පරිදි සෑම වසරක් අවසානයේදි මා එහි ගිය විට එම පණිවුඩකරුම සෑම විටකදීම මුණ ගැසුනි. ස්වාමීන්වහන්සේ විසින් ඉෂ්ඨ කිරීමට යන කාරනා හා උන්වහන්සේගේ රාජ්‍ය අන්තිම දවස් වලදි, පවත්වා ගෙන ගිය යුතු ආකාරය හා පිළිවෙල සම්බන්ධ එම මුණගැසීම් වලදී, උපදෙස් හා අනුමැතිකම් ලබා ගතිමි.

මගේ පියාගේ ලෞකික අවශ්‍යතාවයන්, ඉතාම සීමා සහිත බැවින්, අපට බොහෝ වෙහෙස මහන්සි වී, ලැබුනු සෑම අවස්ථාවකම කුලියට වැඩ කිරීම සිදුවිය. ඇතැම් විට අප නිවෙස් වලය, ඇතැම් විට නිවෙස් වලින් පිටය. නිරන්තරයෙන් වෙහෙස මහන්සි වු බැවින් පහසු ජීවිතයක් ගත කිරීමට හැකිවිය.

*ජෝසෆ් තුමා බොහෝ රැකියා කරමින් තම පවුලට පහසුවෙන් ජිවත්විමට සැලස්සුවේය. වර්ෂ 1825 දී නිව්යෝක් නගරයේ වෙනැන්ගෝ ජනපදයේ රැකියාවක් ඔහු භාරගත්තේය. එහිදි එමා හේල් ඔහුට මුණගැසී, ජනවාරි 18 වෙනි දින ඔවුන් විවාහවුහ.*


අවසානයේදී තහඩුද, යුරිම් හා තුම්මිද කවචයද ලබාගැනීමට කාලය පැමිණියේය. වර්ෂ එක්දාස් අටසිය විසිහතේ සැප්තැම්බර් මස විසිදෙවෙනි දින වසර අවසානයේ සිරිත් පරිදි ඒවා තැන්පත් කර තිබු ස්ථානයට ගිය විට එම ස්වර්ගිය පණිවුඩකාරයා විසින්ම භාරදි මෙම අවවාද දෙන ලදි. මා ඒවා ගැන වගකිව යුතු බවද, අප්‍රවේසමෙන් හෝ අතපසු විමෙන් ඒවා නැතිවුවොත් මා කපා හරින බවද ඔහු කීවේය. නමුත් පණිවුඩකරු ඒවා නැවත භාරගැනීමට පැමිණෙන තෙක්, මාගේ මුළු උත්සාහය යොදා ඒවා ආරක්ෂා කර ගැනීමට උත්සාහ කළ හොත් ඒවා සුරකෙන බවද ඔහු කීවේය.

ඒවා සුරැකිමට මා හට තදින් අවවාද කළේ මක්නිසාද, මා කලයුතු දෙය නිමකල පසු නැවත ඒවා රැගෙන යෑමට පණිවුඩකරු නැවත එන බව කීවේ මන්ද කියා මම වටහා ගත්තෙමි. මා සතුව ඒවා ඇති බව දැනගත් වහාම, ඒවා මගෙන් ගැනීමට නොකඩවා මාන බැලුහ. නමුත් දෙවියන්වහන්සේගේ ප්‍රඥාවෙන්, ඒවා වෙනුවෙන් මගෙන් ඉටුවිය යුතු කාරණය නිමවෙන තෙක් එවා ආරක්ෂා වී තිබුනි. පිළියෙල කර ගත් පරිදි පණිවුඩකරු පැමිණියේය. මම ඒවා ඔහුට භාරදුන්නෙමි. ඒවා අද දින, එක්දහස් අටසිය තිස් අටේ මැයි මස දෙවෙනි දින දක්වා, ඔහු භාරයේ තිබේ.

1829, අප්‍රෙල් 5 වෙනි දින ඔලිවර් කව්ඩ්‍රි මගේ නිවසට පැමිණියේය. එතෙක් මා ඔහු දැක නොතිබිනි. මාගේ පියා ජිවත් වන අසල පාසැලක ඔහු උගන්වන බවත්, මාගේ පියා තම ළමුන් පාසැලට ගෙන යන බැවින්, ඔහු කලක් නේවාසිකව සිටියේය. ඔහු එහි සිටින කාලයේ මාගේ පවුලේ අය, මට ලැබුනු තහඩු ගැන ඔහුන් සදහන් කල බැවින්, ඒ අනුව ඒ ගැන තොරතුරු දැන ගැනීමට පැමිණි බව කීවේය.

කව්ඩ්‍රි මහාතා පැමිණීමෙන් දින දෙකකට පසු (එනම් අප්‍රේල් දින) මෝර්මන්ගේ ග්‍රන්ථය පරිවර්ථනය කිරීමට ආරම්භ කළෙමි. එය මා හට, ලීවීමට ඔහු ආරම්භ කළේය.

*1829 අප්‍රේල් මාසයේදී, ජෝසෆ් ස්මිත් තුමා ඔලිව් කව්ඩ්‍රි ලියන්නා වශයෙන් ගෙන, දෙවියන්වහන්සේගේ දීමනා හා බලය කරන කොට ගෙන මොර්මන්ගේ ග්‍රන්ථය පරිවර්තනය කිරීමට ආරම්භ කළේය. ජෝසෆ් ස්මිත් තුමා එය නිම කලාට පසු, අනිකුත් ජනයාට රන් තහඩු දැකගැනීමේ වරප්‍රසාදය ලැබුනි. මෙම සාක්ෂිවරුන් ඔහුන්ගේ සාක්ෂි වාර්ථා කරනලදී. සාක්ෂිකාරයන් දෙදෙනකුගේවත් තුන්දෙදෙනකුගේවත් මුඛයෙන් සියළු වචන ස්ථිර කරනු ලැබේ. (2 කොරින්ති 13:1)*



*1830 අප්‍රේල් 6 වෙනි දින පීටර් විට්මර් ජොෂ්ඨ මහතාගේ නිවසේදී යේසුස් ක්‍රිස්තුස් වහන්සේ පසු දවස් වල ශුද්ධවරයන්ගෙන් යුත් සභාව සංවිධානය කරන ලදී. නිව්යෝර් නගරයේ නව ආගමික සමාජයක් පිහිටුවීමට මිනිසුන් 6 දෙනෙක් සියලු අවශ්‍යතාවයන් සැපයූ අන්දම 60 දෙනෙකුට ආසන්න ජනතාවක් සිද්ධිය බලාසිටියහ.*

## පූජකවරය නැවත පිහිටුවීම.

තවමත් පරිවර්තනයේ වැඩ නොනවත්වාම කරගෙන ගියෙමු. ඊලග මාසයේ (මැයි මස 1829) යම් දිනක තහඩු පරිවර්තනය කිරීමේදී, එහි සදහන් වූ පරිදි පාප කමාව සදහා බව්තිස්මය පිළිබඳ ස්වාමීන් වහන්සේගෙන් උසා දැන ගැනීම පිණිස යාච්ඤා කිරීම සදහා වනයට ගියෙමු. ස්වාමීන් වහන්සේට මෙසේ යාච්ඤා කරමින් සිටිනා අතර දීප්තිමත් වලාකුලකින් ස්වර්ගයේ සිට පණිවුඩකරුවකු පැමිණ ඔහුගේ අත් අප පිට තබා නියම කොට මෙසේ කීවේය.




*1829 මැයි මස පහළොස් වෙනි දින ස්නාවක යොහාන් තුමාගේ අත් තැබීම මගින් ජෝසෆ් තුමා හා ඔලිවර් කව්ඩ්‍රි ඒරන්ගේ පූජකත්වය ලැබුවේය.*

දේව දූතයින්ගේ උපස්ථාන කිරීමද, පසුතැවිමේ සුභාරංචිය, පව් කමාවට ගිල්විමේ බව්තීස්මය කිරීමේ බලයද යුත් ඒරන්ගේ පූජකත්වය උසුලන යතුර මෙසියස් වහන්සේගේ නාමයෙන්, මාගේ සහෝදර සේවකයන් වන ඔබලා මත පවරමි. තවද ලිවායිගේ පුත්‍රයන් ධර්මිෂ්ඨකමින් ස්වාමින්වහන්සේට පිදුම පුදන තුරු මෙම පූජකත්වය කිසිදිනක මිහිතලයෙන් ඉවත් නොකරනු ලැබේ.


ශුද්ධාත්මයාණන්ගේ දීමනා දානය කිරීම පිණිස අත්තැබීමට ඒරන්ගේ පූජක වරබලය නොමැති බවත් එම වරය පසුව ලැබෙන බවත් කීවේය. බව්තිස්ම වීමට අපට අණකොට උපදෙස් දුන්නේය. පළමුව මා ඔලිවර් කව්ඩ්‍ර බව්තීස්ම කළ යුතු බවත්, පසුව ඔහු මා බව්තීස්ම කළයුතු බවත් කීවේය.

ඊ අනුව අපි ගොස් බව්තීස්මය ලැබුවෙමි. පළමුව මම ඔහු බව්තිස්ම කළෙමි. පසුව ඔහු මා බව්තීස්ම කළේය. — පසුව ඔහු ගේ හිස මත මගේ අත් පා ඒරන්ගේ පූජකවරයට පත්කරන ලදී. ලසුව ඔහු හිස මත තබා එම පූජකවරයට මා පත්කරන ලදී — එසේ අපට අන කරන ලදි.

එම් අවස්ථාවේ අපවෙත පැමිණි පූජකවරය ප්‍රදානය කළ පණිවුඩකරුගේ නම යොහාන් බවත්, අලුත් ගිවිසුමේ ඔහුට ස්නාවක යොහාන් නමින් හැඳින්වෙන බවත් ඔහු කිවේය. මෙල්කිසදෙක් පූජකත්වයේ යතුරු ඉසුලු පේත්‍රැස්, යාකෝබ් සහ යොහාන්ගේ උපදෙස් අනුව ඔහු ක්‍රියා කල බවත්, යථා කාලයේ එම පූජකත්වය අපටද ප්‍රදානය කරන බවත්, මම සභාවේ පළමුවන වැඩිවහල්ලා මෙන්ද, ඔලිවර් කව්ඩ්‍රි දෙවන්නා ලෙස හැඳින්විය වුතු බවද ඔහු කිවේය. 1829 මැයි මස පහලොස් වෙනි දින මෙම පණිවුඩකරු හස්තයෙන් පූජකවරයට පත්කරනු ලැබ, පව්තිස්මය ලබන ලදී.



බව්තිස්මය ලබා ජලයෙන් පිටට ආ සැනෙකින් ස්වර්ගය පියාණන්වහන්සේගේ මාහානුභාවසම්පන්න ආශිර්වාද අප අත්දකින ලදී. මා විසින් ඔලිව කව්ඩ්‍රි බව්තිස්ම කල විගස ශුද්ධාත්මයාණන් වහන්සේ ඔහු මත පැමිණියෙන් ඔහු නැගිට, ඉදිරියට සිදුවන බොහෝ දේ ගැන අනාවැකි පල කළේය. ඔහු විසින් මා බව්තීස්මය කල විට, අනාවැකි කිමේ බලය මමද ලැබ, නැගි සිට සභාව නැගී ඒම හා සභාව ගැන තව බොහෝ දෙවල්ද, මනුෂ්‍ය පුත්‍රයාණන්ගේ පරම්පරා ගැනද, අනාවැකි කීවේය. ශුද්ධත්මයාණන්ගෙන් පිරි, ගැලවීමේ දෙවියන් වහන්සේ තුල අපි ප්‍රිති වුනෙමු.



*මොර්මන්ගේ පොත 1830 පළමුවෙන්ම මුද්‍රණය කළ අතර ලොව පුරා භාෂා 80 කින් දැනට ප්‍රකාශණය කරගෙන යනු ලැබේ.*

*ජෝසෆ් ස්මිත් තුමාගේ සරළ සෘජු සාක්ෂිය මෙය වේ. ඒ තුලින් වැදගත් සිදුවීම් රැසක් ක්‍රියාත්මක විය. එනම් සුභාරංචිය නැවත පිහිටු වීම හා යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාව ස්ථාපනය කිරීම වේ.*

*ජෝසෆ් ස්මිත් තුමාගේ කථාන්තරය ගැන සම්පූර්ණ විස්තරයක් අනගි මුතු ඇටය හෝ සභාවේ ඉතිහාසය 1:2-79 ජෝසෆ් ස්මිත් — ඉතිහාසය බලන්න.*